# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. *Website : www.defence.lk*

මගේ අංකය / எனது இல / My No } MOD/SD/2021(133)

ඔබේ අංකය / உமது இல / Your No }

572 | දුරකථන / தொலைபேசி / Telephone } 2430860-9, 2430870-8 | ලේකම් / செயலாளர் / Secretary } දුර./தொ./Tel. : 011 2381154, ෆැක්ස්/பெ./Fax.: 011 2541529, වි. තැපෑල/மி.அ./Email : secdefence@defence.lk

දිනය / திகதி / Date } 2021 මැයි මස 18 දින


21 MAY 2021

ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛ අංක :- MOD/01/2021

DIRECTOR GENERAL BUDGET & FINANCE 26 MAY 2021

By C of N
Action :
Information :
Sig :
Date : 21/5/2021

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී
යුද්ධ හමුදාධිපති
නාවික හමුදාධිපති
ගුවන් හමුදාධිපති
පොලිස්පති

**යුධමය වාතාවරණය පැවති වකවානුවේ මියගිය ත්‍රිවිධ හමුදා සහ විශේෂ කාර්ය බලකා ඇතුළු ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයින් හා යැපෙන්නන් වෙත සහන හිමිගැන්වීම**

යුධමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල හා ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් හෝ ත්‍රස්ත ක්‍රියා මැඩ පැවැත්වීම උදෙසා සිදුකරන ලද ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ හා මියගිය ත්‍රිවිධ හමුදා, පොලිස හා විශේෂ කාර්ය බලකා සාමාජිකයින් සඳහා ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් ගෙවන ලද වැටුප් හා දීමනා අඩුවීමකින් තොරව ලබා දීම සම්බන්ධයෙන් විධිවිධාන සැලසීමට අංක 21/0561/303/047 හා 2021.04.27 දිනැති තීරණය පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව පහත පරිදි දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය.

2. හිමිකම් ලබන පාර්ශ්වයන් හා ගෙවීම් කළයුතු ආකාරය

2.1 ආරක්ෂක අමාත්‍යාංශයේ අංක MOD/01/2020 හා 2020.07.15 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර මාසික දීමනාව ලබමින් සිටින ආබාධිත ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයින් මියයාමෙන් පසුව ඔවුන්ගේ නීත්‍යානුකූල බිරිඳට හෝ බිරිඳ මියගොස් නම් හෝ නීත්‍යානුකූලව, චාරිත්‍රානුකූලව හෝ වාසය හා සංවාසයෙන් වෙනත් විවාහයකට එළඹී ඇත්නම් රණවිරුවාට දාව උපන් අවුරුදු 26 ට අඩු, රැකියා විරහිත අධ්‍යාපනය ලබන දරුවන්ට මේ වන තෙක් ආබාධිත රණවිරුවාට ගෙවෙමින් පැවති ස්ථාවර මාසික දීමනාව ඒ පරිද්දෙන්ම ගෙවීමට කටයුතු කළ යුතු අතර. එහිදී වැන්දඹුවට හා දරුවන්ට ගෙවන වැටුප් හා දීමනාවල වටිනාකම හමුදා සාමාජිකයා අවසන් වරට ලබමින් සිටි වැටුප් හා දීමනාවල එකතුව ඉක්මවා යාමක් සිදු නොවිය යුතුය.

DI PAY SECTION 01 JUN 2021 | වැ.අ: 105/H/2 | SO (DP) | SO (DPH) | SSI

31 MAY 2021

DI Pay. SUB SR No. 194

2.2 යුධමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල හා ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල 2009.05.19 දිනට පෙර රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් මියගිය විවාහක ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයින්ගේ නීත්‍යානුකූල බිරිඳට හෝ බිරිඳ මියගොස් නම් හෝ නීත්‍යානුකූලව, චාරිත්‍රානුකූලව හෝ වාසය හා සංවාසයෙන් වෙනත් විවාහයකට එළඹී ඇත්නම් රණවිරුවාට දාව උපන් අවුරුදු 26 ට අඩු, රැකියා විරහිත අධ්‍යාපනය ලබන දරුවන්ට, ආරක්ෂක අමාත්‍යාංශයේ අංක MOD/01/2020 හා 2020.07.15 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව මියගිය නිලධාරියා වයස අවුරුදු 55 සම්පූර්ණ වූ විට හිමිවීමට නියමිතව තිබූ පඩනම මත ගණනය කරන ලද ස්ථාවර මාසික දීමනාවක් ලබා දිය යුතුය. මෙයට අමතරව විවාහක සාමාජිකයින්ගේ දෙමව්පියන් ජීවත්ව සිටීනම් මියගිය සාමාජිකයාට වයස අවුරුදු 55 එළඹෙන දින සිට දෙමව්පියන් ජීවත්ව සිටින තුරු ඔවුන්ට රු. 25,000.00 ක ස්ථාවර මාසික දීමනාවක් ගෙවිය යුතුය.

2.3 යුධමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල හා ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල 2009.05.19 දිනට පෙර රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් මියගිය අවිවාහක සාමාජිකයින්ගේ දෙමව්පියන් ජීවත්ව සිටීනම් මියගිය සාමාජිකයාට වයස අවුරුදු 55 එළඹෙන දින සිට දෙමව්පියන් ජීවත්ව සිටින තුරු ඔවුන්ට රු. 25,000.00 ක ස්ථාවර මාසික දීමනාවක් ගෙවිය යුතුය.

2.4 ත්‍රිවිධ හමුදාවන්ට අදාළව ඉහත 2.2 හා 2.3 උපවගන්තියේ සඳහන් යැපෙන්නන් වන්නේ අංක 1982/305(09) හා 1982.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා අංක 18/0111/703/007 හා 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යන තීරණයන් ප්‍රකාරව සහන හිමිගැන්වීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලබා දී ඇති/ලබාදෙනු ලබන 2009.05.19 දිනට පෙර මියගිය විවාහක හා අවිවාහක සාමාජිකයින්ගේ යැපෙන්නන් වේ.

3. පහත 3.1, 3.2, 3.3 හා 3.4 මඟින් දක්වා ඇති පාර්ශවයන් වෙත ස්ථාවර මාසික දීමනාව හිමිගැන්වීම සඳහා වන ඉල්ලීම් පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත නිලධාරී කමිටුවක් වෙත යොමුකර එහි තීරණය අනුව කටයුතු කළ යුතුය.

නිලධාරී කමිටුව

I. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අතිරේක ලේකම්වරයකු - කමිටු සභාපති
II. මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියකු - කමිටු සාමාජික
III. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියකු - කමිටු සාමාජික
IV. රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියකු - කමිටු සාමාජික
V. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු - කමිටු සාමාජික
VI. ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු - කමිටු සාමාජික

VII. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු - කමිටු සාමාජික

VIII. ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු - කමිටු සාමාජික

IX. විශේෂ කාර්ය බලකාය නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ නිලධාරියකු - කමිටු සාමාජික

ඉහත කමිටුවට ඉල්ලුම් කිරීමට හැකියාව ඇති කාණ්ඩ

3.1 ක්‍රියාන්විත ප්‍රදේශවල සෘජුවම ත්‍රස්ත ක්‍රියා නොවන හේතූන් මත ආබාධිතව වෙනත් කිසිදු රැකියාවක නිරත විය නොහැකි යැයි වෛද්‍ය මණ්ඩලයක් මගින් නිර්දේශ කරන ආබාධිත ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයින් හා එම හේතූන් මත මියගිය සාමාජිකයින්ගේ යැපෙන්නන් සඳහා වන ඉල්ලීම.

මේ යටතේ සලකා බලනුයේ අංක අමප/07/2081/305/082 හා 2007.11.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා අංක 18/0111/703/007 හා 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යන තීරණයන් ප්‍රකාරව සහන හිමිගැන්වීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලබා දී ඇති/ලබාදෙනු ලබන 2009.05.19 දිනට පෙර ආබාධිත, මියගිය විවාහක/අවිවාහක සාමාජිකයින් හා යැපෙන්නන් වේ.

3.2 2009.05.19 දිනට පෙර, ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවලදී ත්‍රස්ත ක්‍රියා මැඩපැවැත්වීම උදෙසා සිදුකරන ලද ක්‍රියා හේතුවෙන් ආබාධිතව වෙනත් කිසිදු රැකියාවක නිරත විය නොහැකි යැයි වෛද්‍ය මණ්ඩලයක් මගින් නිර්දේශ කරන ආබාධිත ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයින් හා එම හේතූන් මත මියගිය සාමාජිකයින්ගේ යැපෙන්නන් සඳහා වන ඉල්ලීම්.

මේ යටතේ සලකා බලනුයේ අංක 18/0111/703/007 හා 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සහන හිමිගැන්වීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලබා දී ඇති/ ලබාදෙනු ලබන 2009.05.19 දිනට පෙර ආබාධිත, මියගිය විවාහක /අවිවාහක සාමාජිකයින් හා යැපෙන්නන් වේ.

3.3 2009.05.19 දිනට පෙර පැවති යුධමය වාතාවරණයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාන්විත ප්‍රදේශවල හා ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල සිදු වූ පශ්චාත් යුධ ක්‍රියාකාරකම් (බංකර් ඉවත් කිරීම/පුද්ගල නාශක බෝම්බ ඉවත් කිරීම/බිම් බෝම්බ ඉවත් කිරීම වැනි) වලින් ආබාධිත වන ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයින් හා එම හේතූන් මත මියයන සාමාජිකයින්ගේ යැපෙන්නන් සඳහා වන ඉල්ලීම්.

3.4 යම් නීතිය හා සාමය කඩවීමේ සිදුවීමක් රජය විසින් ත්‍රස්තවාදී ක්‍රියාවක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබූ අවස්ථාවකදී එම සිදුවීම හේතුවෙන් ආබාධිත බවට සනාථ වන ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයින් හා මිය යන ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයින්ගේ යැපෙන්නන් සඳහා වන ඉල්ලීම්.

4. ඉහත හිමිකම් ලබන පාර්ශ්ව සඳහා මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ප්‍රතිලාභ ලබාදීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂයෙන් අවධානය යොමුකළ යුතුය.

4.1 මෙම චක්‍රලේඛ විධිවිධාන පරිදි ප්‍රතිලාභ සඳහා හිමිකම ලැබෙනුයේ අමාත්‍ය මණ්ඩලය විසින් මෙම දීමනාව අනුමත කරන ලද 2021.04.27 දින සිට වන අතර , එදින සිට හිඟ දීමනා ගණනය කර ගෙවීමට කටයුතු කළ යුතුය.

4.2 ස්ථාවර මාසික දීමනාව ගණනය කිරීමේදී රණවිරු සුරැකුම් දීමනාවද ඇතුළත් වන බැවින් රණවිරු සුරැකුම් දීමනාව වෙනම දීමනාවක් ලෙස තවදුරටත් ගෙවීම සිදු නොකළ යුතුය.

4.3 අදාළ හිමිකම් ලබන පාර්ශ්වයන් වෙත මෙම දීමනාවන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් ගෙවීමට කටයුතු කළ යුතු අතර, අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධ ආකෘති පත්‍ර හා අනෙකුත් උපදෙස් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් නොපමාව නිකුත් කිරීමට පියවර ගනු ලැබේ.

4.3.1 මෙම ගෙවීම් සිදුකිරීමට අදාළ ගණනය කිරීම් සිදුකර ගැනීමේ පහසුව සඳහා, අදාළ ත්‍රිවිධ හමුදා සහ පොලිස් සාමාජිකයාගේ වයස අවුරුදු 55 දක්වා එම සාමාජිකයාගේ යැපෙන්නා වෙත හිමිගන්වන ලද වැටුප් හා දීමනා සම්බන්ධ නිවැරදි තොරතුරු නියමිත දිනට ත්‍රිවිධ හමුදා සහ පොලිස් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

4.4 වරින් වර විශ්‍රාම වැටුප හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙහි සංශෝධනයන් සිදුකළද ඉහත පරිදි ගණනය කරන ලද ස්ථාවර මාසික දීමනාවේ අගය නොවෙනස්ව ගෙවීමට කටයුතු කළ යුතුය.

4.5 මෙම චක්‍රලේඛය යටතේ දෙමාපියන් යනු අදාළ ත්‍රිවිධ හමුදා හා ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයාගේ නීත්‍යානුකූල දෙමාපියන් පමණි. දෙමාපියන් දෙදෙනාම ජීවත්ව සිටින අවස්ථාවකදී අදාළ දීමනාව උපරිමය රු. 25,000.00 ට යටත්ව සම සමව මව හා පියා වෙත වෙන් වෙන්ව ගෙවිය යුතු අතර මව හෝ පියා පමණක් ජීවත්ව සිටින අවස්ථාවකදී සම්පූර්ණ දීමනාව ජීවත්ව සිටින පුද්ගලයා වෙත හිමිවිය යුතුය. ඒ පිලිබඳ යම් ගැටළුවක් මතු වේ නම්, උක්ත 3 ඡේදය මඟින් දක්වා ඇති කමිටුවට ඉදිරිපත් කර කමිටුවේ නිර්දේශ ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

4.5.1. දෙමාපියන් වෙත රු.25,000.00 ක දීමනාව සමඟ යැපෙන්නන්ගේ දීමනාව හිමිගන්වන අතර, ත්‍රිවිධ හමුදා වෙතින් ඔවුන් වෙත වෙනත් කිසිදු දීමනාවක් හිමි ගැන්වීම සිදු නොකළ යුතුය.

4.6 මෙම නිර්දේශයන් ශ්‍රී ලංකා පොලිසියට අදාළව ක්‍රියාත්මක කිරීමේදී, අදාළ විධිවිධාන සැලසීමේ වගකීම පොලිස් විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත පැවරිය යුතුය.

4.7 ඒ ඒ කාර්තුව අවසානයේ මෙම දීමනා හිමිගැන්වීම සඳහා ත්‍රිවිධ හමුදා වෙතින් නිර්දේශකර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇති අයවළුන් සම්බන්ධ තොරතුරු ඇතුළත් වාර්තාවක් ත්‍රිවිධ හමුදාධිපතිවරුන් විසින් ආරක්‍ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෙ

සම්බන්ධව සකස්කර ඇති පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාමට ත්‍රිවිධ හමුදාධිපතිවරුන් විසින් වගබලා ගත යුතුය.

මෙයට අදාළව ශ්‍රී ලංකා පොලිසිය විසින් සකස් කරනු ලබන වාර්තාව ඒ ඒ කාර්තුව අවසානයේ පොලිස් විෂය භාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර මේ සම්බන්ධව සකස්කර ඇති පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාමට පොලිස්පති විසින් වගබලා ගත යුතුය.

4.8 මෙම චක්‍රලේඛයේ සඳහන්ව ඇති පොලිස් සාමාජිකයින් යන්නට පොලිස් විශේෂ කාර්ය බලකා සාමාජිකයින්ද ඇතුළත්වේ.

4.9 මෙම චක්‍රලේඛය යටතේ දීමනා හිමිගන්වන මියගිය සාමාජිකයින්ගේ කාලත්‍රයන් නීත්‍යානුකූලව, චාරිත්‍රානුකූලව හෝ වාසය හා සංවාසයෙන් නැවත විවාහයකට එළඹී නැති බව, දරුවන් වයස අවුරුදු 26 ඉක්මවා නොමැති බව, රැකියා විරහිත බව, අධ්‍යාපනය ලබන බව, යහපත් කල්ක්‍රියාවෙන් ජීවත්වන බව සහ දීමනා හිමිගන්වා ඇති සියළුම සාමාජිකයින් ජීවත්ව සිටින බව තහවුරු කිරීම සම්බන්ධ වාර්තාවක් වාර්ෂිකව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ලබාගෙන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීමට ත්‍රිවිධ හමුදාධිපතිවරුන් හා පොලිස්පති විසින් කටයුතු කළ යුතුය. ඊට අමතරව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්නා විධිවිධාන අනුව ඕනෑම අවස්ථාවක හිමිකම්ලාභියා තහවුරු කර ගැනීමට කටයුතු කරනු ඇත.

4.10 මෙම චක්‍රලේඛය මහජන ආරක්ෂක අමාත්‍යාංශය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව නිකුත් කරනු ලැබේ.

**ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)**
**ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්**
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පිටපත්:-

I. ජනාධිපති ලේකම් - ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.ස
II. අමාත්‍ය මණ්ඩල ලේකම් - අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.ස
III. ලේකම් - මුදල් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
IV. ලේකම් - රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
V. ලේකම් - මහජන ආරක්ෂක අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
VI. විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය - කරු. දැ.ගැ.ස
VII. අධ්‍යක්ෂ ජනරාල් - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස